නිපුණතාව 2 - ඉල්ලුම,සැපයුම,නම්‍යතාව හා වෙළෙඳපොල සමතුලිතය සමතුලිතය විශ්ලේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.8 - සැපයුම් ප්‍රමාණයේ වෙනස් වීම හා සැපයුම වෙනස්වීම අතර වෙනස සසඳයි.

- මිල හැර සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල වෙනස් වන විට එම භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණයේ ඇතිවන වෙනස සැපයුම් ප්‍රමාණය වෙනස් වීමයි.
- සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් කරුණු ස්ථාවරව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල වැඩි වන විට එම භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය වැඩි වේ.එය සැපයුම් වක්‍රය මත පිහිටි ලක්ෂ්‍යය එම වක්‍රය දිගේ තවත් ඉහළ ලක්ෂ්‍යයකට ගමන් කිරීමකි.
- සැපයුම කෙරෙහි බලපාන අනෙකත් කරුණු ස්ථාවරව තිබියදී සලකන භාණ්ඩයේ මිල අඩු වන විට එම භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය අඩුවේ.එහිදී සැපයුම් වක්‍රය ලක්ෂ්‍යයක සිට එම වක්‍රය දිගේ තවත් පහළ ලක්ෂ්‍යයකට ගමන් කරයි.

1.සැපයුම් ප්‍රමාණය අඩු වීම හා වැඩි වීම රූප සටහනක දක්වන්න.
2.සැපයුම වෙනස්වීම යනු කුමක්ද?සැපයුම අඩු වීම හා වැඩි වීම රූප සටහනක දක්වන්න.
3.සැපයුම් වක්‍රය දකුණට ගමන් කිරීමට බලපාන හේතු 5ක් හා සැපයුම් වක්‍රය වමට ගමන් කිරීමට බලපාන හේතු 5ක් ලියන්න.